# සාම්ප්‍රදායික කොසු ඉඳල් කර්මාන්තය (පොතුපිටිය ග්‍රාමය ඇසුරින්)

කල්දේරා කේ.ආර්.සී.එස්,[1] ජීවන්තක ජී.වී.ඕ.[2]

ශ්‍රී ලංකාව යනු උරුමයන්ගෙන් පිරුණු භූමියකි. මෙම උරුමයන් අස්පෘෂ හා ස්පෘශ වශයෙන් ආකාර දෙකකි. මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කරන්නේ පාරම්පරික ව පැවත එන සාම්ප්‍රදායික ගෘහස්ථ කර්මාන්තයක් වන කොසු ඉඳල් කර්මාන්තය පිළිබඳව යි. මෙම කර්මාන්තය තම වටපිටාව පිරිසිදු කර ගැනීමට ඇති වූ අවශ්‍යතාව මත ඉතා සරල ආකාරයෙන් සමාජය තුළ විකාශනය වූවකි. මෙම පර්යේෂණය සඳහා පාදක වන අධ්‍යයන ප්‍රදේශය වන්නේ බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයේ පොතුපිටිය ග්‍රාමය යි. මෙම ග්‍රාමයේ පාරම්පරික ව පැවත එන කොසු ඉඳල් කර්මාන්තයට වසර සියයකට අධික දිගු ඉතිහාසයක් ඇත. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ මෙම කර්මාන්තයේ ඉතිහාසය, තාක්ෂණය, වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම සහ මෙහි පැවැත්ම සඳහා අවශ්‍ය යෝජනාවලියක් ඉදිරිපත් කිරීම වේ. මෙම කර්මාන්තයේ ඉතිහාසය 1800 වැනි සියවස දක්වා දිව යයි. පොතුපිටිය ග්‍රාමයේ වාසය කරන පියසිරි මහතාගේ පරම්පරාවේ මුතුන් මිත්තන් මෙම කර්මාන්තයේ ආරම්භක පිරිස් වේ. මේ සඳහා අතීතයේ ඉතා සරල තාක්ෂයක් භාවිතා වී ඇත. වර්තමානය වන විට විවිධ කෘත්‍රිම අමුද්‍රව්‍ය ද මෙම කර්මාන්තයේ දී යොදා ගැනෙයි. ඉඳල් සඳහා පොල් ඉරටු, ලී හා තහඩු භාවිතා කරන අතර කොසු සඳහා පොල් කොහු, ලී, ලණු, තහඩු හා ප්ලාස්ටික් භාවිත කරයි. මෙම කර්මාන්තයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසීමේ දී බොහෝ දෙනා සාම්ප්‍රදායික තාක්ෂණයෙන් ඈත් වී ප්ලාස්ටික් භාවිතයෙන් මේවා නිෂ්පාදනය කිරීමට යොමු වී ඇත. අතීතයේ ස්වභාවික පොල්ලෙලි වළවල් ආශ්‍රිත ව සිදු වූ මෙම ගෘහස්ථ හස්ත කර්මාන්තය මේ වන විට නවීන යන්ත්‍ර සූත්‍ර ඇසුරෙන් සිදු වේ. අතීතයේ සිට මේ දක්වා මේ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී විශාල වෙනසක් හඳුනා ගත හැකි ය. මෙම පර්යේෂණය සඳහා ක්‍රමවේදය වශයෙන් ප්‍රාදේශික ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය, ක්ෂේත්‍ර නොවන ගවේෂණය, දත්ත විශ්ලේෂණය හා දත්ත ඉදිරිපත් කිරීම සිදු කර ඇත. මෙහි දී ප්‍රාදේශික ගවේෂණය මඟින් මෙම ග්‍රාමයේ ඉතිහාසය හා පාරිසරික තත්ත්වය අධ්‍යනය කර ඇත. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ එම ක්ෂේත්‍රයට ගොස් තාක්ෂණික ක්‍රමවේදය නිරීක්ෂණය සිදු කළ අතර සම්මුක සාකච්ඡා මඟින් ග්‍රාමයේ හා කර්මාන්තයේ ඉතිහාසය ලබා ගැනීම සිදු කරන ලදී. තව දුරටත් වර්තමානයේ මෙම හස්ත කර්මාන්තයට උදා වී ඇති ඛේදජනක ඉරණම පිළිබඳව ක්ෂේත්‍ර ගවේෂණයේ දී දැන ගැනීමට හැකි විය. මෙම පර්යේෂණය අවසානයේ එළඹිය හැකි වූ නිගමනය නම් සාම්ප්‍රදායික කොසු ඉඳල් කර්මාන්තය දේශිය උරුමයක් හා සාම්ප්‍රදායික තාක්ෂණයක් වශයෙන් රටේ දියුණුවට අතිශය වැදගත් වන බවයි.

**මුඛ්‍ය පද :** උරුමය, කොසු/ඉඳල් කර්මාන්තය, තාක්ෂණය, සාම්ප්‍රදායික, දේශීය

[1]පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sewwandicharitha97@gmail.com